විමර්ශි 32

## චැනල් 4 සහ අපේ මාධ්‍ය

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යයට බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී සේවාව දෙවැනි වරටත් ප්‍රබල මාතෘකාවක් වී තිබේ. පළමු වරට එම සේවාවට අදාලව මාධ්‍ය වාර්තාකරණයක් දකින්නට ලැබුණේ පසු ගිය මැයි මස 9 වැනිදා අත්අඩංගුවට ගෙන 10 වැනිදා ශ්‍රී ලංකාවෙන් පිටුවහල් කළ චැනල් 4 මාධ්‍යවේදීන් තිදෙනා නිසාය. එයට හේතුව වූයේ ශ්‍රී ලංකාවට පැමිණි මෙම මාධ්‍යවේදීන් වව්නියාවේ අවතැන් කඳවුරුවල ජනතාව මුහුණ දෙන මානුෂවාදී ගැටළු ගැන වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමය. එම වාර්තාව දුටු බලධාරීන්ගේ නියෝග පරිදි වහාම ඔවුන් අත්අඩංගුවට ගෙන පිටුවහල් කරන ලදී. මෙම සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍ය වාර්තා කළ ආකාරය එවර අපගේ නිරීක්ෂණයට ලක් විය. මෙවර සිදුවීම ඊට වඩා බරපතලය. මෙවර ඔවුන් විකාශනය කර ඇත්තේ ශ්‍රී ලංකාවට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල වන ආකාරයේ වීඩියෝ දර්ශනයකි. එහෙයින් මෙය ශ්‍රී ලංකා රජයේ දැඩි අවධානයට හා අප්‍රසාදයට හේතු වී ඇති ආකාරය ඒ සම්බන්ධ මාධ්‍ය වාර්තා නිරීක්ෂණයෙන් පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ ලක්ෂ තුනක් ජනතාව අවතැන් කළ යුද්ධයට සම්බන්ධ වාර්තාකරණයක් හරහා මතු වූ ගැටළුවක් බැවින් එම ගැටළුව දෙස ශ්‍රී ලංකාවේ මාධ්‍ය බලා ඇති ආකාරය විමසීම මෙවර අපගේ අරමුණ විය.

සැප්තැම්බර් මස මුල් සතිය පුරාමත් මෙම වාර්තාව ගැන කර ඇති පරීක්ෂණ හා ගන්නට යන ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් රජයේ බලධාරීන්ගේ ප්‍රකාශ ඇතුළත් වාර්තා ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළ දකින්නට ලැබුණද අප විසින් නිරීක්ෂණය කරන ලද්දේ අගෝස්තු මස 24 වැනි දින සිට 30 දක්වා දින හයක කාලයක පළ වූ මාධ්‍ය වාර්තාය. අගෝස්තු 25 වැනි දින වීඩියෝ පටය විකාශනය වීමෙන් පසු ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය ඒ ගැන මුලින්ම වාර්තා කරන්නේ 27 වැනිදාය. සියළු වාර්තා නිරීක්ෂණයෙන් පසු වීඩියෝ පටය හරහා විකාශනය වූයේ හමුදා නිල ඇඳුමෙන් යුතු පුද්ගලයකු විසින් නිරායුධ දෙමළ තරුණයින් නිරුවත් කර වෙඩි තබා ඝාතනය කළ ආකාරය බව වටහා ගැනීමට හැකිය. එය ජනවාරි මස සිදුවීමක් බවත්, සෙලියුලර් දුරකතනයකින් රූපගත කළ එකක් බවත්, එය ලබා දී ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ සංවිධානය බවත් එම තොරතුරුවලින් අනාවරණය වෙයි. සිංහල පුවත්පත් පහක අදාල කාලය තුළ වාර්තා/ලිපි/කතුවැකි 9ක් දකින්නට ලැබුණු අතර, වීඩියෝ පටයේ ඇතුළත් කරුණු, ඒ සඳහා රජයේ බලධාරීන්ගේ ප්‍රතිචාර මෙන්ම ජාත්‍යන්තර වශයෙන් එයින් සිදු වී ඇති බලපෑම ආදිය ගැන සමබර නිරීක්ෂණයක් ඇතුළත් වන්නේ එක් තීරු ලිපියක කොටසක් ලෙසින් (ඉරිදා ලංකාදීප) පමණි. ඒ සම්බන්ධ තමන්ගේ විරෝධයක් හෝ රජයේ විරෝධය හා සමපාත වීමක් එහිදී දක්නට නැත. නමුත් ''එක් අමානුෂීය සිදුවීමක් ඇතුළත් වීඩියෝ දර්ශනයක්'' යන යෙදුම හා වීඩියෝවේ අන්තර්ගතය සඳහන් කිරීමේදී භාවිතා කර ඇති භාෂා ශෛලිය අනුව සිදුවීම දෙස කම්පාවෙන් බලා ඇති ආකාරයක් පෙන්නුම් කෙරේ. රජයේ මාධ්‍ය පුවත්පත (දිනමිණ) පුවත් 3ක් පළ කර ඇති අතර රජයේ බලධාරීන්ගේ විරෝධය පමණක් ඒවාට මූලාශ්‍ර කර ගෙන ඇත. වීඩියෝවේ අන්තර්ගතය ගැන කිසිදු සටහනක් නැතත් එය ලබා දුන්නේ කවුරුන්ද යන්න ගැන පරස්පර අදහස් දෙකක්ද ඒවාට ඇතුළත් වේ. වැඩ සටහන තුළින්ම එය ලබා දුන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ බව සඳහන් කර ඇති බව බොහෝ වාර්තාවල සඳහන් වුවත් මෙහිදී එක් පුවතකට ඇතුළත් වී ඇත්තේ ජර්මනියේ සහ ප්‍රංශයේ වෙසෙන එන්ජීඕ මාධ්‍යවේදීන් දෙදෙනෙකු එය ලබා දී ඇති බවයි. තවත් පුවතක සිරස්තලයෙන්ම කියන්නේ චැනල් 4 සිද්ධිය පිටුපස ''නිදහසේ වේදිකාවේ පිරිසක්''සිටින බවයි. තවත් පුවත්පතක (දිවයින) වාර්තා 2ක් ඇතුළත් වන නමුත් එම පුවත්පත පමණක් කියවන වන පාඨක ප්‍රජාවටද වීඩියෝ පටය ගැන කිසිවක් වටහා ගත හැකි ආකාරයට වාර්තා කර නැත. අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මූලාශ්‍ර කර ගත් එක් පුවතක සඳහන් ''ශ්‍රී ලංකා යුද හමුදා කීර්ති නාමයට හානි වන අයුරින්'' යන වගන්තියෙන් හමුදාව ගැන යමක් එහි ඇති බව පාඨකයනට උපකල්පනය කිරීමට සිදුවේ. අනෙක් පුවතින් වීඩියෝව ලොව පුරා බෙදා හැරියේ ජර්මනියේ සිංහල කොටි බව සිරස්තලයෙන්ම කියා සිටී. දිනපතා පුවත්පත් දෙකක් (ලංකාදීප සහ ලක්බිම)මේ පිළිබඳ වාර්තා කර නැත.

ඉංග්‍රීසි පුවත්පත්වල සිංහල පුවත්පත්වලට වැඩි, එනම් ප්‍රධාන පුවතක් ඇතුළු පුවත් 11ක් කතුවැකි 2ක්, කාටූනයක් සහ වීඩියෝවෙන් උපුටා ගත් තරුණයින් ඝාතනය කරන ඡායාරූප 2ක්

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

ඇතුළත්ය. කතුවැකි දෙකෙන්ම (අයිලන්ඩ් සහ ලක්බිම නිව්ස්) මෙවැනි වාර්තාවක් පළ කිරීම ගැන විවේචනය කරයි. කාටූනයෙන්ද (ඩේලි මිරර්) ප්‍රකාශ වන්නේ යුද ජයග්‍රහණ නම් කුසලානයට යුද අපරාධ නම් කුණුකසල හලන බවකි. ප්‍රධාන සිරස්තලයකින් මෙම සිද්ධිය වාර්තා කරන්නේ එම පුවත්පත පමණි. සිදුවීම සම්බන්ධයෙන් රජය නිකුත් කළ නිවේදනයක් මූලාශ්‍ර කර ගත් පුවතක් පළමු දිනයේ ඇතුළු පිටුවක වාර්තා කරන එම පුවත්පත (ඩේලි මිරර්) නිවේදනයේ ඇතුළත් අදහස සිංහල පුවත් වාර්තාවලට වඩා පැහැදිලිව සඳහන් කරයි. වීඩියෝවේ අන්තර්ගතය සඳහන් කරන එම වාර්තාවට හමුදාව අගයන හමුදා මාධ්‍ය ප්‍රකාශකගේ අදහසක්, ප්‍රංශ පුවත් සේවයේ වාර්තාවක් ද මූලාශ්‍ර කර ගනී. එම පුවත්පත දෙවැනි දින ප්‍රධාන පුවතක් ලෙස සිදුවීම වාර්තා කරන්නේ රජයේ මාධ්‍ය සාකච්ඡාවේදී අනුර අනුර ප්‍රියදර්ශන අමාත්‍යවරයා දක්වූ අදහස් මූලාශ්‍ර කර ගෙනය. පළමු පුවතේ සඳහන් ආකාරයට වීඩියෝ දර්ශනයේ සඳහන් දේ, එය ලබා දුන් අය, එයට වෙනත් ජාත්‍යන්තර මාධ්‍ය හරහාද ප්‍රමුඛතාවක් ලැබුණු බව වැනි කරුණුද ඇතුළත්ය. මෙම වැඩ සටහනට විරෝධය දක්වූ ඇමැතිවරයා බටහිර මාධ්‍ය සංවිධානවලට අනතුරු අඟවා ඇති බවද මෙම පුවතින් වාර්තා වේ. කෙසේ වෙතත් මෙම වාර්තාවලින් සිංහල මාධ්‍යවලට වඩා පැහැදිලි චිත්‍රයක් එම පුවත්පතේ පාඨයන්ට ලබා ගත හැකි අතර වාර්තා සියල්ල නිරීක්ෂණයෙන් පැහැදිලි වන්නේ චැනල් 4 රූපවාහිනිය යම් වැරැද්දක් කර ඇති බව පුවත්පත පිළිගෙන ඇති බවකි. ඡායාරූප දෙක පළ කර ඇති සති අන්ත ඉංග්‍රීසි පුවත්පතේ (සන්ඩේ ලීඩර්) වාර්තාවෙන් ලබා ගත හැකි නිරීක්ෂණයද ඉහත කී පුවත්පතට තරමක් දුරට සමානය. තවත් පුවත්පතක (අයිලන්ඩ්) එක් වාර්තාවක් විශේෂයෙන් කැපී පෙනෙයි. එය ටොරොන්ටෝ ස්ටාර් නම් පුවත්පතක පළ වූ ලිපියක් බව ඇඟවේ. එම ලිපියට මූලාශ්‍ර රැසක් ඇතුළත්ය. කැනඩාවේ මූලාශ්‍ර, ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශ, චැනල් 4 මාධ්‍යවේදී ජොනතන් මිලර්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයකු වැනි මූලාශ්‍රද ඒ අතර වේ. මෙම වීඩියෝවෙන් පෙන්වන දේ අළුත් දෙයක් නොවන බවත් මෙවැනි දේ කලක සිට සිදුවන බවට මෙය එක් උදාහරණයක් බවත් එක් මූලාශ්‍රයකින් කියැවේ. කෙසේ වුවත් මෙම ලිපියෙන් ගම්‍ය වන්නේ මෙවැනි දේ සිදු විය හැකි බවට විශ්වාසය තහවුරු කරන බවයි.

දෙමළ මාධ්‍ය වාර්තාකරණය ප්‍රමාණාත්මකව අනෙක් මාධ්‍යයට වඩා මෙහිදී කැපී පෙනේ. ප්‍රධාන පුවත් 2ක්, වාර්තා 17ක් සහ ඡායාරූපයක් එම වාර්තා අතර වෙයි. නමුත් සිදුවීම ප්‍රතික්ෂේප කරන එක් පුවතක් පමණක් රජයේ මාධ්‍ය පුවත්පතේ (තිනකරන්) පළවේ. කෙසේ වුවත් විශේෂය වන්නේ, වීඩියෝ දර්ශනය සම්බන්ධ මුල් පුවතට ප්‍රමුඛතාව ලැබෙන ප්‍රධාන පුවතක් එක් පුවත්පතක් (සුඩර් ඔලි) පළ කර තිබීමය. එහි අඩංගු කරුණු සාධාරණීකරණය කරන අන්තර් ජාතික මූලාශ්‍ර රැසක් එම පුවතට මූලාශ්‍ර කර ගෙන ඇති අතර ඒ හරහා අන්තර් ජාතික පරීක්ෂණයක් අවශ්‍ය බවටද අවධාරණයක් කරයි. එමෙන්ම ශ්‍රී ලංකාව පාර්ශ්වයෙන් කර ඇති ප්‍රතික්ෂේප කිරීමද අනෙක් මාධ්‍යයට වඩා වැඩි වාර ගණනකින් වාර්තා කර ඇත. ඉහත කී පුවත්පතම පළ කර ඇති තවත් පුවතකින් ඝාතනවලට චැනල් 4 වීඩියෝව හොඳ සාක්ෂියක් බැවින් මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර අධිකරණයට ගෙන යා යුතු බව කියයි. ඒ සඳහා මූලාශ්‍රය ඉන්දියානු දේශපාලනඥ වයිකෝය. සිරස්තල යොදා ගැනීමේදීද වීඩියෝ දර්ශනයට පිළිගැනීමක් ලබා දේ. අනෙක් පුවත්පත් දෙක (වීරකේසරී සහ තිනක්කුරල්) වීඩියෝවේ අන්තර්ගතය, රජයේ ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් පුවත් මෙන්ම වෙනත් විදේශීය නියෝජිතයන් ඒ සම්බන්ධයෙන් සංවේදීව කළ ප්‍රකාශ ඇතුළත් පුවත් ද වාර්තා කර ඇත. කෙසේ වෙතත් අනෙකුත් මාධ්‍යයට වඩා මෙම කාරණය සම්බන්ධයෙන් දෙමළ මාධ්‍ය සංවේදී වී ඇති ආකාරය, එයට පක්ෂ විපක්ෂ හෝ ඒ ගැන සංවේදීව හෝ කළ ප්‍රකාශ මූලාශ්‍ර කර ගත් වාර්තා වැඩි ගණනක් පළ කිරීමට උනන්දු වීමෙන් පෙනේ. රජයේ බලධාරීන්ගේ අනුමැතියෙන් ලබා දුන් යුද පිටයේ වාර්තා හා ජනතාවට සිදු වූ විපත් ගැන සසඳා බලන විට ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම ලෝකයටද තවමත් බොහෝ දේවල් රහස්‍ය. අවතැන් කඳවුරු තවමත් ලෝකයට විවෘත නැති රහසක්ය. රහස් ලෙස තබා ගන්නට උත්සාහ කරන දේවල් විවිධ මුහුණුවරින් පිටාර ගැලීම සිදු වේ. එවැනි තත්ත්වයක් යටතේ ඒ ගැන සංවේදී අයට මෙවැනි සිදුවීමක් ගැන සැක සිතෙන්නේද නැත. ජනමාධ්‍ය සොයා බැලිය යුත්තේ ඒ ගැනය. ජනමාධ්‍ය කළ යුත්තේ ඒවා ගැන එසේ නොවේයැයි එකහෙළා කරන ප්‍රකාශ වාර්තා කිරීමට සීමා වීම හෝ පාර්ශ්වීය ලෙස ඔවුනට පහර ගැසීම හෝ නොව ඒවා ගැන සොයා බලා ජනතාවගේ හිත සුව පිණිස, ජනතාවට පක්ෂපාතීව සාධාරණව වාර්තා කිරීමය.

**සීතා රංජනී** **seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com